



අමා දහර ප්‍රසංගය නැවත වරක්

# නර්තනයේ නව මං සොයන අමා

අපට පසුගිය වසරේ අමා විජේසේකර හමු වුණේ ඇගේ "අමා දහර" ප්‍රංසගය පිලිබඳ කතිකාවකදී ය. යළිත් එවන් ප්‍රසංගයක් පිලිබඳව සැම විටම කලා ශිල්පීන් හා ඔවුන්ගේ නිර්මාණ සමග එක්ව සිටින සන්නසේ අපට ඇය හා කතා බහක යෙදෙන්නට මේ වසරේදීත් අවස්ථාව ලැබීම සතුටට කරුණකි.

*ශ්‍රීනාත්*
ගිය වසරේ ප්‍රසංගය නැරඹීමට බොහෝ දෙනෙකුට නොහැකි වුණ බව අපට මතකයි. මේ වසරේ ඔබ එයට යම් පිලියමක් යොදල තියෙනවාද?

*අමා*
ඔව්. ගිය වසරේ වුණ ඒ අපහසුතාව මගහරවා ගැනීමට මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දෙමාපියන් සමග සම්බන්ධ වී ඔවුන්ගේ දැඩි කැපවීම මත මෙවර දර්ශන වාර දෙකක් අපි ඉදිරිපත් කරනවා. ඒ වැඩ පිළිවෙල ගැන මම සතුටු වෙනවා මෙවර ප්‍රසංගය 2009 අප්‍රේල් මස 5 වන දා සවස 2 ට සහ 6.30 ට බර්වුඩ් හි බිසන් සෙන්ටර් හිදී පවත්වනවා.

*ශ්‍රීනාත්*
මෙවර ප්‍රසංගයට ශිෂ්‍යයන් කොපමණ දෙනෙක් සහභාගි වෙනවද?

*අමා*
මෙවර ප්‍රසංගයට රංගන ශිල්පීන් 150ක් පමණ සහභාගි වෙනව. මෙම 150ට වයස අවුරුදු තුනේ සිට 50 දක්වා වයස් කාණ්ඩ වල ශිල්පීන් සහ ශිල්පිණියන් සහභාගි වෙනවා.

*ශ්‍රීනාත්*
මෙවර ප්‍රසංගයේ මුහුණුවර ගැන විස්තරයක් කරන්න පුලුවන් ද?

*අමා*
මෙම ප්‍රසංගයේදී මම බලාපොරොත්තු වෙනවා සම්ප්‍රදායික නර්තන නිර්මාණ 50% ක් සහ ඉතිරි අඩ නව නිර්මාණ වලිනුත් පෝෂණය කිරීමට.

*ශ්‍රීනාත්*
ඇයි නව නිර්මාණ වලට වැඩි ඉඩකඩක් දෙන්නෙ? එතකොට අපේ සම්ප්‍රදායික කලාංග යට යනවා නේද?

*අමා*
නැහැ... එහෙම වෙන්නේ නැහැ.. හැම දෙයක්ම අලුත් වන ලෝකයක නැටුම් කතාවේත් නව නිර්මාණ වලට අපි හිත යොමු කරන්න ඕනෙ. නටුම් කලාවේ නව ප්‍රවනතා හඳුනුගෙන ඒවා අපේ ප්‍රේකශකයට හඳුන්වා දෙන්නත් ඕනෙ. එයින් මා අදහස් කරන්නෙ නෑ සම්ප්‍රදායික නර්තනය බැහැර කළ යුතුයි කියලා. අපි සැමවිටම සම්ප්‍රදායික නර්තනය ඉතා ඉහළින් සළකා ගරු කරනවා. ඒ වගේම මගේ නැටුම් පුහුණු කිරීම් පන්ති වලදී මම මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උඩරට සම්ප්‍රදායික නර්තනය හා භරත නාට්‍යම් ශාස්ත්‍රානුකූල ලෙස උගන්වනවා.

*ශ්‍රීනාත්*
ඔබ මෙම ප්‍රසංගයේ ඇඳුම් නිර්මාණය හා සංගීතය පිලිබඳව විශාල සැලකිල්ලක් දක්වා ඇති බවක් පෙනෙනවා. ඒ ගැන පැහැදිලි කළොත්.

*අමා*
නැටුම් අංගයකදී ඇඳුම් සහ සංගීතය ඉතාමත්ම අත්‍යවශ්‍ය දෙයක්. නැටුම කොපමණ හැඩ වුවත් ඇඳුම් සහ සංගීතය ඒ සමග බද්ධ වුණේ නැත්නම් එය අලංකාර නැහැ. ඒ නිසා මම ඒ අංග පිලිබඳ වැඩි සැළකිල්ලක් දක්වනවා. මෙවර ප්‍රසංගයේ සියලුම ඇඳුම් නිර්මානය කරන්නේ මමමයි.

මේ ප්‍රසංගයට සම්ප්‍රදායික සංගීතය හා බටහිර සංගීත බන්ඩ යොදා ගන්නවා. ඒ ගැනත් වැඩි අවදානයක් යොමු කර තිබෙනවා. මේ ප්‍රසංග යේදී අපි බලාපොරොත්තු වෙනවා එකකට එකක් වෙනස් ආකාරයේ නිර්මාණ ඉදිරිපත් කරන්න. ඒ කියන්නෙ සැම නර්තනාංග යක්ම රංග වින්‍යාසය තාල රටා සංගීතය රිද්මය කියන සැම දෙයින්ම එකිනෙකට වෙනස් ආකාරයකට නිර්මාණය කරන්න අපි උත්සාහ කර තිබෙනවා. එසේ කරන්නේ ප්‍රේක්ෂකයන්ගේ උදෙ‍්‍යාගිමත්ව මේ ප්‍රසංගය නරඹන්න අවස්තාව දෙන්නයි.

*ශ්‍රීනාත්*
මේ ප්‍රසංගය සාර්ථක කරගන්නට ඔබට සහයෝගය ලබා දෙන අය කවුද?

*අමා*
මේ ප්‍රසංගයේ සාර්ථකත්වය පිටුපස මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සියලුම දෙමාපියන් ඉන්නවා. ඒ අයගේ සහයෝගය මට නොඅඩුව ලැබෙනවා. මේ ප්‍රසංගයේ බර බොහෝ දුරට කරට අරගෙන ඉදිරියට ගෙන යන්න මට ධෛර්යය හා ශක්තිය දෙන්නෙ ඒ දෙමාපියන්. ඒ ගැන විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි. ඒ එක්කම මගේ ස්වාමියා දමින්ද සිරිවර්ධනත් මතක් කළ යුතුයි. මේ ප්‍රසංග යේ වේදිකා පරිපාලනය දෙමාපියන්ගේ සහයෝගය ඇතිව ඔහු අතින් සිදුවෙනවා.

ඒ එක්කම මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කැපවීම ගැන කියන්න වචන නෑ. ඔවුන් මේ ප්‍රසංගයට එක් කරන ජීවය විස්මිතයි.

*ශ්‍රීනාත්*
ඔබේ ඉදිරි වැඩ කටයුතු ගැන යමක් කියන්න පුලුවන්ද?

*අමා*
මගේ නර්තන පන්ති නිසි ලෙස දිගටම කරගෙන යාම මගේ ලොකුම බලාපොරොත්තුවයි. එමගින් නර්කනයට ඇලුම් කරන අපේ සමාජයේ ලොකු කුඩා සැමට මට හැකි අයුරින් සේවයක් කරන්න මට ඉඩ ලැබේ යයි මම හිතනවා. දැනට මම ඩැන්ඩිනොන් ප්‍රයිමරි පාසලේ දී සිකුරාදා සවස 5 සිට 8 දක්වාත් සෙනසුරාදා 1 සිට 5 දක්වාත් මවුන්ට් වේවලි හිදී බ්‍රහස්පතින්දා සවස 6 සිට 8 දක්වාත් සෙන්ට් ඕල්බන්හිදී සෙනසුරාදා උදේ 9 සිට 11 දක්වාත් හොපර්ස් ක්‍රොසින්හිදී අඟහරුවාදාත් පන්ති පවත්වනවා.

මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය අයට මගේ 9706 0134 හෝ 0424 321 656 යන දුරකතන අංක වලට කතා කර දැනගන්න පුලුවන්. ප්‍රසංගයේ විස්තරද ඔබට අවහ්‍ය ප්‍රවේශපත් ද මේ අංක වලටම කතා කර වෙන් කරගන්න පුලුවන්. එයට අමතරව ශ්‍රී ලාංකික වෙළඳසල් වලින්ද ප්‍රවේශපත් ලබා ගන්න පුලුවන්.

150කට වැඩි නර්තන ශිල්පීන් ශිල්පිනියන් සහභාගිවන "අමා දහර" නර්තන ප්‍රසංග ය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපූරු ප්‍රසංගයක්. එය නැරඹීමට ලැබෙන මේ අවස්ථාව පැහැර නොහරින ලෙස නර්තනයට ඇලුම් කරන සන්නස පාඨක ඔබ සැමගෙන් ඉල්ලා සිටිනවා.

**ශ්‍රීනාත් මද්දුමගේ**

